පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර කලාව I ,

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 01 යි.**

❖ **සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. පඩි පෙළ දෙපස ඇති මෙම කලා නිර්මාණය .................................................................................... නමින් හඳුන්වයි.
2. මෙම නිර්මාණය ........................................................................................................................ යුගයට අයත් වේ.
3. මෙම කලාත්මක අතින් උසස් නිර්මාණය ..............................................................................................  දක්නට ලැබේ.
4. මෙම සුවිසල් නිර්මාණය කිරීම සඳහා ........................................................................................................ මාධ්‍ය භාවිතා කර ඇත.
5. මෙය ..................................................................... කටකින් විහිදී යන ඇත් සොඬක් , දියරැල්ලක් ආකාරයෙන් නිමවා ඇත.

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. තාපසයන්ගේ ශීලය පවා බිඳීමේ බලයක් ඇති යැයි පැවසෙන සාම්ප්‍රදායික පුෂ්පය කුමක් ද? ........................................................
7. මහනුවර යුගයේ දී නිර්මාණය වූ කලාත්මක අතින් උසස් සඳකඩ පහණ පිහිටියේ කුමන ස්ථානයේ ද? ...................................
8. තීරු සහිත දක්නට ලැබෙන වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කළේ කුමන වර්ෂයේ ද? .......................................................
9. දුම්බර පන් පැදුරු කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයින් හඳුන්වන පොදු නාමය කුමක් ද? .........................................................
10. සංඛ නිධි හා පද්ම නිධි බහිරව රූප සහිත මුරගල් දෙක දක්නට ලැබෙන්නේ කුමන ස්තූපයේ දොරටුවේ ද?..........................

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට **යටින් ඉරක් අඳින්න.**

11. කල්පිත සත්ත්ව නිර්මාණයක් වන "යාලි රුව" දක්නට ලැබෙන්නේ,

(1) හින්දු කෝවිල්වල ය. (2) ඉස්ලාම් පල්ලිවල ය.

(3) බෞද්ධ පන්සල්වල ය. (4) ක්‍රිස්තියානි පල්ලිවල ය.

12. බන්ධුල හරිශ්චන්ද්‍ර ශිල්පියා විසින් "දිනමිණ" පුවත්පතට අඳින ලද පළමු ජාතක කතාව වන්නේ,

(1) අන්ධභූත ජාතකයයි. (2) වෙස්සන්තර ජාතකයයි.

(3) මනිචෝර ජාතකයයි. (4) සුලසා ජාතකයයි.

13. එස්. පී. චාර්ලිස් ශූරීන් විසින් නිර්මාණය කළ සෙංකෝලයේ මිට සාදා ගැනීමට භාවිතා කළේ,

(1) කොහොඹ ලී වර්ගයයි. (2) බුරුත ලී වර්ගයයි. .

(3) කළුවර ලී වර්ගයයි. . (4) තේක්ක ලී වර්ගයයි.

14. රෝස වර්ණ සාදා ගැනීම සඳහා එකතු කළ යුතු වර්ණ යුගලය වන්නේ,

(1) රතු සහ කොළ වර්ණයන් ය. (2) රතු සහ සුදු වර්ණයන් ය.

(3) රතු සහ කහ වර්ණයන් ය. (4) රතු සහ දම් වර්ණයන් ය.

15. හින්දු ආගමික උත්සව සඳහා භාවිතා කළ "මරවාහනම්" නිර්මාණය කිරීම දියුණු තත්වයට පත්වන්නේ,

(1) පල්ලව හා චෝල කාලයේ දීය. (2) පල්ලව හා ගුප්ත කාලයේ දීය.

(3) ගුප්ත හා චෝල කාලයේ දීය. (4) මථුරා හා ගුප්ත කාලයේ දීය.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. මස්ජිදය :..................................................................................................

..................................................................................................

17. සප්තනාරි පැල්ලැක්කිය :..................................................................................................

..................................................................................................

18. ඇඹීම :..................................................................................................

..................................................................................................

19. සටාකාර :..................................................................................................

..................................................................................................

20. අල්ප උන්නත :..................................................................................................

..................................................................................................

- අංක 21 සිට **25** තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති **A,B,C,D, සහ E** යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය **තිත් ඉරි මත** ලියන්න.

21.  (,..............)



A

22.  (,..............)



B

23.  (,..............)



C

24.  (,..............)



D

25.  (,..............)



E

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

26. ලාක්ෂා කර්මාන්තය වර්තමානයේ වඩාත් සක්‍රීයව පවතින්නේ මාතලේ .............................................................. ප්‍රදේශයේ ය.

27. බුද්ධ ප්‍රතිමා තෙළීමේ දී එහි නිවැරදි මිණුම් ලබා ගැනීම සඳහා ........................... නම් උපකරණය භාවිතා කරනු ලැබේ.

28. ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව වන ."නීලා" .................................................................. ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.

29. හින්දු භක්තිකයින් විසින් .................................................................. උත්සවයේ දී කෝලම් රටාවලින් ගෙබිම අලංකාර කරයි.

30. පොළොන්නරු යුගයට අයත් කලාත්මක මුරගල ................................................................................................ දක්නට ලැබේ.

• අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන සම්ප්‍රදායික සැරසිල්ල කුමන නමකින් හඳුන්වන්නේ ද? ..............................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන වටදාගෙය කුමන යුගයකට අයත්වේ ද? ..............................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන දැව භාණ්ඩවල මතුපිට අලංකාර කිරීම කරන කලා කර්මාන්තය කුමක්ද ? ....................................

34. I අක්ෂරයෙන් දැක්වෙන යාපනයේ මූලායිහි සිත්ති විනයාගර් කෝවිලේ ඇති රථයේ නම කුමක්ද ? ....................................

35. J අක්ෂරයෙන් දැක්වෙන බුද්ධ ප්‍රතිමාවේ මුද්‍රාව කුමක්ද ?..............................................................

• මෙහි දැක්වෙන රූපය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍යය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු **නොලැබීමට** හේතුවක් වනු ඇත.)



36. කලා කර්මාන්තය පිළිබඳව :..............................................................

..............................................................

37. නිර්මාණය කිරීමේ පළමු පියවර :..............................................................

..............................................................

38. අමුද්‍රව්‍ය පිළිබඳව :..............................................................

..............................................................

39. වර්ණ කිරීම පිළිබඳව :..............................................................

..............................................................

40. ප්‍රචලිත ප්‍රදේශ පිළිබඳව :..............................................................

..............................................................

( ලකුණු 40 )

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර කලාව - II - III,

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය පැය 2. 30 යි.

## චිත්‍ර කලාව -II
## රේඛා අධ්‍යයනය හා වර්ණ චිත්‍රය

1. දොඩම් ගෙඩියක් ඇඳ පැන්සලෙන් එළිය අඳුර දක්වන්න. ( ලකුණු 05 )

2 කළගෙඩියක්, ඇඳ වර්ණ කරන්න. ( ලකුණු 15 )

---

## චිත්‍ර කලාව - III

**"අ" කොටස "ආ" කොටස හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

**"අ" කොටස - චිත්‍ර සංරචනය.**

1. ගොවිපලක වැඩ කරන ගොවියෝ,
2. ක්‍රීඩා උළෙලක අවස්ථාවක්,
3. වනයේ සැරිසරන සතුන්,
4. මුහුදු වෙරළක්,

**"ආ" කොටස - මෝස්තර නිර්මාණ.**

5. ස්වභාවික මල් කොළ ඇසුරෙන් චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. සමචතුරස්‍රාකාර හැඩයෙන් යුතු කුෂන් කවරයකට මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. සාම්ප්‍රදායික සැරසිලි යොදා ගනිමින් පිත්තල බන්දේසියක් නිර්මාණය කරන්න.

**"ඉ" කොටස - ග්‍රැපික් චිත්‍ර.**

8. සබන් දවටනයකට සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.
9. "වෙස් මුහුණු කලාව" පිළිබඳ ලියවුණු පොතකට පිටකවරයක් නිර්මාණය කරන්න.
10. "මාර්ග නීති පිළිපදිමු" තේමාව යටතේ පෝස්ටර් සිතුවමක් නිර්මාණය කරන්න.

( ලකුණු 40 )

2023 තෙවන වාර පරීක්ෂණය
9 ශ්‍රේණිය - චිත්‍ර කලාව
I පත්‍රය පිළිතුරු

01. කොරවක් ගල
02. අනුරාධපුර
03. රත්නප්‍රාසාදයේ
04. කළුගල්
05. මකර
06. නාරිලතා මල
07. දළදා මාළිගයේ
08. 1949
09. කින්නර
10. අභයගිරිය
11. (1) හින්දු කෝවිල්වල ය.
12. (4) සුලසා ජාතකයයි. .
13. (3) කළුවර ලී වර්ගයයි.
14. (2) රතු සහ සුදු වර්ණයන් ය.
15. (1) පල්ලව හා චෝල කාලයේ දීය.

- **(අංක 16 සිට 20 දක්වා දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වනසේ පිළිතුරු ලියා ඇති නම් ලකුණු ලබා දෙන්න.)**

16. ස්ලාම් දේවස්ථාන හැඳින්වෙන නමකි.
17. කාන්තාවන් හත්දෙනෙකුගේ රූප පැල්ලැක්කියක ආකාරයෙන් සම්පිණ්ඩනය කළ නිර්මාණයකි.
18. ඇඹීම සඳහා පහසුම මාධ්‍යය මැටි මාධ්‍යය වේ. /මාධ්‍ය භාවිතයෙන් කොටස් එකතු කරමින් ගෙඩනැගීම.
19. කළයක් මුනින් අතට නැමු හැඩයකි./ස්තූපවල ගර්භය නිර්මාණයේ දී භාවිතයට ගෙන ඇති හැඩයකි.
20. කැටයමක ස්වල්පයක් මතුකර දක්වීම මින් අදහස්වේ. /භාගයකට වඩා අඩුවෙන් මතු කිරීම.
21. C
22. A
23. E
24. B
25. D
26. හපුවිද
27. ලඹතටුව
28. G.S.ප්‍රනාන්දු
29. තෛපොංගල්
30. පොළොන්නරු වටදාගෙය
31. කිහිඹි මුහුණ /කීර්ති මුඛ
32. අනුරාධපුර
33. ලාක්ෂා
34. සිම්ම වාහනම් /සිංහ රථය
35. ධ්‍යාන
36. ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස් මුහුණු කලා කර්මාන්තය දක්වේ.
37. ලී කඳන් කපා පොතු ගසා කැබිලිවලට කපා ගැනීම වේ. (ගණ කැපීම)
38. දිය කදුරු සහ රුක් අත්තන දුව වර්ග පැරණි ශිල්පීන් භාවිතා කර ඇත.
39. මුලින්ම සුදු පැහැති ආලේපනයක් තවරා ගැනීම/සුදු පැහැති වර්ණය සාදා ගැනීමට කිරිමැටි ,මකුළු මැටි භාවිතාකර තිබීම මුලින්ම තවරන ආලේපනය අල්ලියාදු නමින් හැඳින්වේ. /අතීතයේ කහ වර්ණය සඳහා හිරියල් ද රතු වර්ණය සඳහා සාදිලිංගම් ද යොදා ගෙන ඇත. / අතීතයේ දී බෝවිටියා, කී කිරිඳිය, රණවරා, මැ ආදි පැලෑටි වලින්ද වර්ණ සකස් කර ඇත.
40. දකුණු පළාතේ අම්බලංගොඩ, බෙන්තර, මිරිස්ස, මතුගම, රයිගම් කෝරළය යන ප්‍රදේශවල පැවත ඇත. ප්‍රදේශ එකක් හෝ කීපයක් ඇතුලත් කර වාක්‍යක් ලියා ඇත්නම් ලකුණක් ලබාදෙන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න